

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
ANNUAL REPORT
2022

ලෝහෝර් ආර්යා ණය අරමුදල – **මුදල් අමාත්‍යාංශය**
லோஹோர் சீமாட்டி கடன் நிதியம் - **நிதி அமைச்சு**
Lady Lochore Loan Fund - **Ministry of Finance**

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

2022



ලෝහෝර් ආර්යා ණය අරමුදල	– මුදල් අමාත්‍යාංශය
லோஹோர் சீமாட்டி கடன் நிதியம்	- நிதி அமைச்சு
Lady Lochore Loan Fund	- Ministry of Finance

පටුන

සංස්ථාපිත තොරතුරු **01**

සභාපතිතුමියගේ පණිවුඩය **02**

පාලන භාරකාරතුමියගේ පණිවුඩය **03**

1. අරමුදලේ පසුබිම **04**

1.1 භාරකාර මණ්ඩලය **04**

- 2022 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය **04**

1.2 සංවිධාන ව්‍යුහය **05**

2. **2021** වසරේ අරමුදලෙහි කාර්යසාධනය

2.1 2022 වසරේ ප්‍රතිලාභීන් **06-09**
2.2 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය **10-11**
2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම **11**
2.4 ණය අයකර ගැනීමේ ප්‍රගතිය **11-12**
2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල **12**
2.5.1 කුලී ආදායම **12**
2.5.2 අරමුදලෙහි තිරසාරභාවය **13**
2.5.3 මෙහෙයුම් ආදායම **13**

3. සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 සේවක අභිප්‍රේරණය ඉහළ නැංවීම **(කාර්ය මණ්ඩල පුහුණුව - 2021)** **14**

3.2 අරමුදලේ බදවා ගැනීමේ සහ උසස්වීම් පරිපාටින් **14**

- නව බදවා ගැනීම් **14**

3.3 අරමුදල් පරිශ්‍රය නවීකරණය කිරීම **15**
3.4 කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම/අරමුදලේ සංවත්සර සැමරුම **15-17**
3.5 කාර්ය මණ්ඩල ණය **18**
3.6 ඉඩම් ඔප්පු සහ බැදුම්කර **18**
3.7 රැස්වීම් **18**
3.8 විගණන හා කළමණාකරණ කමිටුව **18**

4. අනාගත සැලසුම් **19**
5. ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව **20**
6. ආදායම් ප්‍රකාශනය **21**
7. මූල්‍ය තත්ව ප්‍රකාශනය **22**
8. ප්‍රාග්ධන වෙනස්වීමේ ප්‍රකාශය **23**
9. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය **24**
10. ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති
    - පොදු **25**
    - වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම **25**
    - වගකීම් සහ ප්‍රතිපාදන **26**
    - ආදායම් ප්‍රකාශනය **27**
11. මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන් **28-32**

ලෝහෝර් ආර්යා ණය අරමුදල

දැක්ම

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා මූල්‍ය පහසුකම්
සලසා දෙනු ලබන ප්‍රමුඛ ආයතනයක් ලෙස ක්‍රියා කිරීම.

මෙහෙවර

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් සහ
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් ණය බරින් මුදවා යහපත් මානසික පරිසරයකින් යුත්
රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම සඳහා දායකවීම.

අරමුණ

රාජ්‍ය හා රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවකයින් හා
ත්‍රිවිධ හමුදා සාමාජිකයින් සඳහා සහනශීලි පොලී අනුපාතයක් හා පහසු
කොන්දේසි මත
කෙටි කාලීන ණය මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම මඟින්
ඔවුන්ව ණය බරින් මුදවා ගැනීම.

කාර්ය භාරය

- ණය අරමුදල තිරසාරව පවත්වා ගනිමින් සේවා ලාභීන් සඳහා ණය පහසුකම් සැපයීම.
- ආයතනික ප්‍රවර්ධනය සහ එයට සාපේක්ෂව ධාරිතාවය වැඩි කිරීම.
- අරමුදල් සම්පාදනය කර ගනිමින් ආයතනය පවත්වා ගැනීමට අවශ්‍ය ක්‍රියා පටිපාටින් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.
- ණය කළමනාකරණය සඳහා යෝග්‍ය වන ක්‍රමෝපායන් දියුණු කිරීම සහ ණය දීමේ පහසුකම් කාර්යක්ෂමව කිරීම සහ වැඩි දියුණු කිරීම.
- අනිකුත් රාජ්‍ය ආයතන වල සේවකයින් සඳහා වූ ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ දී පහසු කාරකයෙකු වශයෙන් කටයුතු කිරීම.
- ණය ලබා දීමේදී හා කටයුතු පවත්වාගෙන යාමේදී විධිමත් මූල්‍ය පාලන ක්‍රමවේදයක් ඇතිව කටයුතු කිරීම.

සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම ලිපිනය :

- ලෝහෝර් ආර්යා ණය අරමුදල
- 100 3/2, ශ්‍රීමත් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

සංස්ථාපිත කිරීම :

- 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල භාරකාර මණ්ඩල පනත (1953 සංශෝධිත) යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක ව්‍යවස්ථාපිත ආයතනයකි.

භාරකාර මණ්ඩලය :

➢ ඒ. පී. කුරුම්බලපිටිය මහතා	-	සභාපති, (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - කළමණාකරණ විගණන දෙපාර්තමේන්තුව), මුදල් අමාත්‍යාංශය. (2022.03.07 දින දක්වා)
➢ ජේ.කේ.එන්.සමන්මලී මැතිණිය	-	සභාපති, (අධ්‍යක්ෂක - ආයෝජන හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව), (2022.03.07 දින සිට)
➢ කමලා රණතුංග මැතිණිය	-	පාලන භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	-	භාරකාර
➢ ප්‍රදීප් නිරෝෂන් වීරසිංහ මහතා	-	භාරකාර, (2022.10.29 දින දක්වා)
➢ ඒ.එස්.පී.එස්.පී.සංජීව මහතා	-	භාරකාර, (2022.10.29 දින දක්වා)
➢ එම්.සී.සුබසිංහ මහත්මිය	-	භාරකාර, (2022.11.09 දින සිට)
➢ සරිත් පතිරත්න මහීපුත්‍ර මහතා	-	භාරකාර, (2022.11.09 දින සිට)

විගණන කමිටුව :

➢ කේ.එම්.බී.පී.වීරසිංහ මැතිණිය	- සභාපති, (ප්‍රධාන ගණකාධිකාරී, මුදල් අමාත්‍යාංශය)
➢ තුෂාර සෙනෙවිරත්න මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල)
➢ ඒ.එස්.පී.එස්.පී.සංජීව මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල) (2022.10.29 දින දක්වා)
➢ සරිත් පතිරත්න මහීපුත්‍ර මහතා	- සාමාජික (භාරකාර, ලෝහෝර් ආර්යා ණය අරමුදල) (2022.11.09 දින සිට)

විගණක :

HMW ඇසෝසියේට්ස්,
වරලත් ගණකාධිකාරී,
28, යූ.ඊ.පෙරේරා මාවත,
රාජගිරිය.

නිල බැංකුකරු :

මහජන බැංකුව,
මූලස්ථාන ශාඛාව,
කොළඹ 02.

සභාපතිතුමියගේ පණිවුඩය

වසර තුනක පමණ කාලයක් පැවති කොරෝනා වසංගතයෙන් මිදී, පෙර පරිදි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යාමට 2022 වර්ෂය තුලදී හැකියාව ලැබූ අතර, කොරෝනා වසංගතය සහ ගෝලීය ආර්ථිකයේ ඇති වූ පසුබෑම තුල ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වූ දැඩි ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා අනුගමනය කල ඉහල බැංකු පොලී අනුපාත හා ණය ගැනීම අධෛර්යමත් කිරීම වැනි ප්‍රතිපත්ති තුලින් අපහසුතාවයට පත් වූ රාජ්‍ය නිළධාරින් විශාල ප්‍රමාණයකට මෙම වර්ෂය තුලදී සහනයක් සැලසීමට හැකිවිය. ඒ අනුව 2022 වර්ෂය මෙම අරමුදලේ නිර්මාතෘවරිය වන ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාවගේ ආරම්භක අරමුණ වූ ණය බරින් පීඩිත වුවන් ඉන් ගලවාගෙන සහන සැලසීම සඳහා වඩාත් දායක වූ වර්ෂයක් ලෙස හඳුනා ගත හැක.

අරමුදලේ මූල්‍ය කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කිරීමේදී පසුගිය වර්ෂයන්හි ලබාගත් ප්‍රගතිය තවදුරටත් සාර්ථකව ඉදිරියට ගෙන යාමට අරමුදල සමත්ව ඇති බව නිරීක්ෂණය වේ. පෙර වර්ෂය හා සැසඳීමේදී මුළු ආදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.මි. 14.7 කින් වැඩි වී ඇති අතර, මෙහෙයුම් වියදමෙහි වැඩි වීම රු.මි.2.7 කට සීමා කර ගැනීමට අරමුදල සමත් විය. සමස්ථ ආර්ථික පසුබෑම හමුවේ පසුගිය වර්ෂය තුල පහල වැටී තිබූ අරමුදලේ බදු පෙර ශුද්ධ ලාභය රු.මි. 60 ක් දක්වා වැඩිකර ගැනීමට හැකියාව ලැබිණි. තවද බදු වශයෙන් රු.මි.15.8 කින් රජයේ ආදායමට දායක වීමට හැකි වීම සහ රජයේ අරමුදල් මත යැපීමෙන් තොරව ස්වාධීනව තම මෙහෙයුම් කටයුතු සිදු කරන රාජ්‍ය ව්‍යවසායක් වශයෙන් පවත්වාගෙන යාමට හැකි වීම තුලින් වර්තමාන ආර්ථික අර්බුදයෙන් මිදීම සඳහා අනුගමනය කල යුතු ප්‍රතිපත්ති වෙනුවෙන් සක්‍රීය දායකත්වයක් ලබා දීමට අරමුදලට හැකිවිය.

2022 වර්ෂයේදී රාජ්‍ය සේවකයන් 2705 ක් සඳහා රු.මි.484 ක් ණය පහසුකම් වශයෙන් ලබා දීමට අරමුදල සමත් වූ අතර, එය පෙර වර්ෂ වල ලබාදුන් ණය ප්‍රමාණයන්ට සාපේක්ෂව ඉතා ඉහළ ප්‍රමාණයක වැඩිවීමකි. මෙම වර්ෂයේ ක්‍රියාත්මක වූ බැංකු පද්ධතිය තුලින් ලබාදෙන ණය අධෛර්යමත් කිරීමේ ප්‍රතිපත්තිය තුල රාජ්‍ය සේවකයන් විශාල ප්‍රමාණයක් අරමුදලින් ණය ලබා ගැනීමට නැඹුරු වීම හේතුවෙන් ඇති වූ ඉහල ණය ඉල්ලුම අරමුදල සතු සීමිත මූල්‍ය සම්පත් තුල කළමණාකරන කර ගැනීම අරමුදල මුහුණ දුන් විශාල අභියෝගයක් විය. පෙර වර්ෂවල ණය සඳහා වූ ඉල්ලුම අඩු වීම හේතුවෙන් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර තිබූ මුදල් නැවත ලබා ගෙන ණය ගෙවීම වැඩිකර ගැනීම තුලින් එම අභියෝගයට පුර්ණ වශයෙන් නොවුණද යම්තාක් දුරට සාර්ථකව මුහුණ දීමට අරමුදල සමත් විය. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව අරමුදලින් ණය ලබාගත් රාජ්‍ය සේවකයින් ප්‍රමාණය 200% කින් පමණ වැඩි වී ඇත.

එමෙන්ම මූල්‍ය වත්කම් උපරිම ඵලදායිතාවයෙන් යොදා ගැනීම සඳහා ජංගම ගිණුම තුල නිරන්තරයෙන් සංසරණය වූ අතිරික්ත අරමුදල් තාවකාලිකව මූල්‍ය වෙළඳපොල ඉතිරි කිරීමේ ගිණුමක (Money Market Savings Account) ආයෝජනය කිරීම තුලින් අමතර ආදායමක් උපයාගත හැකිවිය. තවද භෞතික සම්පත් සංවර්ධනය යටතේ 1960 දශකයේ පමණ නිමකර තිබූ අරමුදල පවත්නා ගොඩනැගිල්ලෙහි විදුලි පරිපථ පද්ධතිය වෙනුවට නව විදුලි පරිපථ පද්ධතියක් ස්ථාපනය කර ගැනීම මගින් පැරණි විදුලි පරිපථ පද්ධතිය තුලින් ආයතනයට ඇති ව තිබූ අවධානම ඉවත් විය.

2022 වර්ෂයේ ඉහල කාර්යසාධනයක් අත්පත් කර ගැනීම සඳහා භාරකාර මණ්ඩලය, ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීමේදී ලබාදුන් දායකත්වය ඇගයීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ඒ සියල්ලටම ඉහලින් මේ සඳහා කාර්ය මණ්ඩලය දැක්වූ දායකත්වය නොවන්නට මෙම කාර්යසාධනය ළඟා කර ගැනීමට නොහැකි බව නොඅනුමානය.

ඒ අනුව 2023 වර්ෂයේදී අරමුදල ලඟා කරගත් ප්‍රගමනය තවදුරටත් ඉදිරියට ගෙන යාමට කාර්ය මණ්ඩලයට හැකිවේවායි! ප්‍රර්ථනා කරන අතර , භාරකාර මණ්ඩලය සමග කටයුතු කරමින් ඒ සඳහා කැපවෙන බවට සහතික වෙමි.



ජේ.කේ.එන්.සමන්මලී
සභාපති
ලෝහෝර් ආර්යා ණය අරමුදල.

පාලන භාරකාරතුමියගේ පණිවුඩය

ලෝහෝර් ආර්යා ණය අරමුදල ආරම්භ කර වසර 95 ක් සමරන 2022 වර්ෂයේ දී 2020-2021 වර්ෂවලදී උද්ගත වූ කොරෝනා ගෝලීය වසංගත තත්ත්වයෙන් මිදීමට මුළු මහත් ලෝකවාසී සැමටත් ශ්‍රී ලංකාවාසී අප සැමටත් හැකි වී තිබීම සතුටට කරුණකි.ඒ අනුව මෙම අරමුදලේ මෙහෙයුම් කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට තිබූ ප්‍රධාන බාධාවක් තුරන් වීම මත අරමුදලේ නිර්මාතෘතුමිය වන ජීන් ලෝහෝර් ආර්යාවගේ අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණු උපරිම ආකාරයෙන් ආවරණය වන පරිදි මෙහි මෙහෙයුම් කටයුතු මෙම වසර තුලදී දියත් කිරීමට හැකිවිය.

රාජ්‍ය සේවා ණය අයදුම්කරුවන් 2705 දෙනෙකු සඳහා රු.මිලියන 484.1 ක් ණය වශයෙන් ප්‍රදානය කිරීමට හැකිවීම මත එම පිරිස් සඳහා සිය හදිසි මූල්‍ය අවශ්‍යතාවයන් වෙනුවෙන් යම් පිළිසරණක් සැපයීමට හැකි වී තිබීම මත ලෝහෝර් ආර්යාවගේ එකී ආරම්භක අරමුණු මෙම වසරේ දී උපරිම වශයෙන් ළඟාකර ගැනීමට හැකි වී තිබීම ආඩම්බරයට කරුණකි.මෙයට සමගාමීව ණය අවකරණ ලෙස රු.මිලියන 267 ක් අයකර ගැනීමෙන් අනතුරුව රු.මිලියන 113.5 ක සමස්ත ආදායමක් උපයමින් ද රු.මිලියන 60.4 ක බදු පෙර ශුද්ධ ලාභයක් උපයා රු.මිලියන 15.8 ක බදු ආදායමක් රජයට සපයා දී රු.මිලියන 44.6 ක බදු පසු ශුද්ධ ලාභයක් ලඟාකර ගැනීමට හැකි වී තිබීම ඉමහත් සතුටට කරුණකි.

මෙම වසරේ දී අපේක්ෂිත මෙහෙයුම් කටයුතු උපරිම තලයකට ලඟා වීමට හැකි වී තිබීම මත 2023 වර්ෂය සඳහා මෙම තත්ත්වය ඉතාමත් ධනාත්මක ආකාරයෙන් අරමුදලේ ප්‍රගතිය සඳහා බලපෑ හැකි බව මා දැඩි ලෙස විශ්වාස කරමි.

මෙවන් ප්‍රගතියක් අත්පත් කරගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ලබාදෙමින් නිරන්තරයෙන් අත්වැලක් සැපයූ මෙහි භාරකාර මණ්ඩලයත් සියළු උපදෙස් හා මහපෙන්වීම් සිදුකරන මුදල් අමාත්‍යාංශයත් කැපවීමෙන් මෙහෙයුම් කටයුතු සිදුකරන අරමුදලේ කාර්යය මණ්ඩලයත් මෙකී සාර්ථකත්වයේ නියමුවන් සේ හැඳින්විය හැක.

ඉදිරියේ දී මෙහි සේවාවන් තව තවත් ව්‍යාප්ත කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කරන අතර අපගේ නිර්මාතෘතුමියගේ අභිමානාර්ථවලට අනුගතව තවදුරටත් එම කාර්යයන් පුළුල් කිරීමට ආයතනයේ භාරකාර මණ්ඩලයට හා කාර්යය මණ්ඩලයට ශක්තිය ධෛර්ය හා වාසනාව ලැබේවා ! යි ප්‍රාර්ථනා කරමි.

කමලා රණතුංග
පාලන භාරකාර
ලෝහෝර් ආර්යා ණය අරමුදල

01

අරමුදලේ පසුබිම

ශ්‍රී ලංකාවේ කලක් වාසය කල ස්කොට්ලන්ත ජාතික ජීන් ලෝහෝර් ආර්යාව විසින් ණය අරමුදලක් පිහිටුවීමට අවශ්‍ය මූලික ප්‍රාග්ධනය සඳහා පවුම් 300 ක මුදලක් පරිත්‍යාග කර තිබිණි. එවකට පුණ්‍ය කොමසාරිස්ව සිටි සී.ඊ.වී.නැතනියල්ස් පියතුමා අරමුදල පිහිටුවීමේ කාර්යයෙහි මූලිකව කටයුතු කර ඇති අතර එය 1927 මාර්තු 26 වන දින ලෝහෝර් ආර්යා ණය අරමුදල නමින් ආරම්භ කරන ලදී. එමෙන්ම අරමුදල 1951 අංක 38 දරණ ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනත මගින් ව්‍යවස්ථාපිත ආයතනයක් බවට පත් විය.

එදා සිට මෙම අරමුදල ප්‍රතිලාභීන් වෙත ණය ප්‍රදානය කරමින් සහ එම ණය ආපසු අයකර ගනිමින් චක්‍රිය අරමුදලක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් පවතී. රාජ්‍ය අංශයේ මෙන්ම වෙළඳ සමාගම්වල සේවය කරන සේවකයින්ටද තමන්ගේ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සපුරා ගැනීමට එවකට පැවති බැංකු ක්‍රමයෙන් පිටිවහලක් නොලැබුන හෙයින් ඔවුන් අධික පොළියට ණය සපයන පුද්ගලයන්ගෙන් ණය ලබා ගැනීමට පුරුදු වී සිටියහ. මේ පසුබිම තුල රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ද ණය බරින් පීඩනයට පත්විය. මෙවැනි පරිසරයක් තුල ලෝහෝර් ආර්යා ණය අරමුදල පිහිටුවීමෙන් පසු මෙම සේවකයින්ට ණය ලබා ගැනීමේදී ඉමහත් සහනයක් සැලසුනි. 1951 මෙම පනත ව්‍යවස්ථාගත වීමත් සමගම අරමුදලට රජයෙන් මෙන්ම වෙනත් පරිත්‍යාගශීලීන්ගෙන් ද ලැබුන ආධාර උපයෝගි කරගෙන මෙම ආයතනයටම අයත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර ඇත.



ජීන් ලෝහෝර් ආර්යාව

1.1. භාරකාර මණ්ඩලය




භාරකාර මණ්ඩලය ගරු මුදල් ඇමතිතුමා විසින් පත් කරනු ලබන රාජ්‍ය අංශයේ සහ සුදුසුකම්ලත් පෞද්ගලික අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. මෙම ආයතනයෙහි අනුශාසක ධුරය මුදල් අමාත්‍යතුමා විසින් හොබවනු ලබයි. අරමුදලෙහි පරිපාලන කටයුතු සඳහා පාලන භාරකරුවකු ලෝහෝර් ආර්යා ණය අරමුදල් පනතේ 10 වන හා 11 වන වගන්ති ප්‍රකාරව භාරකාර මණ්ඩලය සඳහා පත් වූ අය අතරින් කෙනෙකු පත්කරනු ලැබේ. එම පනතෙහි 5 වන වගන්තියට අනුව භාරකාර මණ්ඩලයෙහි සභාපති තනතුර භාණ්ඩාගාර නියෝජිතවරයා වෙත පවරා ඇත.

වගුව 01 – 2022 වසරේ අරමුදලේ කාර්යය මණ්ඩලය

අනුමත තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	සේවයේ නියුතු සංඛ්‍යාව
ගණකාධිකාරී	01	01
පරිපාලන නිලධාරී	01	01
ගිණුම් නිලධාරී	01	01
අභ්‍යන්තර විගණක නිලධාරී	01	01
ණය අයකර ගැනීමේ නිලධාරී	01	01
තොරතුරු තාක්ෂණ නිලධාරී	01	-
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන ශ්‍රේණිය)(ලේඛනාගාර සහකාර ඇතුළු)	34 (35)	28
ගොඩනැගිලි අධීක්ෂක (කළමනාකරණ සහකාර - තාක්ෂණික ශ්‍රේණිය)	01 (35)	-
කාර්යාල කාර්ය සහායක (ප්‍රාථමික ශිල්පීය නොවන) (නිල බංගලා භාරකරු ඇතුළුව)	07	06
ගොඩනැගිලි නඩත්තු සහායක (ප්‍රාථමික අර්ධ ශිල්පීය)	01	01
රියදුරු (ප්‍රාථමික ශිල්පීය)	02	02
එකතුව	**51**	**42**

1.2 සංවිධාන ව්‍යූහය



02

2022 වසරේ අරමුදලෙහි කාර්යසාධනය


2.1 2022 වසරේ ප්‍රතිලාභීන්

2022 වසරේදී රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සේවකයින් 2705 ක් මෙම අරමුදලේ ප්‍රතිලාභීන් වී ඇත. එම ප්‍රතිලාභීන් පදිංචි දිස්ත්‍රික්කය අනුව දෙවන වගුවෙහි වර්ගීකරණය කර ඇති අතර ගෝලීය වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීමත් ,විවිධ සීමා පැනවීමත්,බැංකු පොළී අනුපාතිකය රජය විසින් පහත හෙලීමත් හේතුවෙන් 2021 වර්ෂයේදී අඩුවූ ණය ප්‍රමාණය නැවතත් 2022 200% කින් ඉහා දැවැන්ත ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී. ප්‍රතිලාභීන්ගෙන් 75% අධික පිරිසක් ආරක්ෂක අංශයේ නියුතු පුද්ගලයින් වන බව පහත වගුවෙන් නිරූපනය වේ

වගුව 01 – 2021/2022 වර්ෂවල ණයලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව

ප්‍රතිලාභීන් සංඛ්‍යාව				
දිස්ත්‍රික්කය	**2022**	**(%)**	**2021**	**(%)**
කොළඹ	582	21.52	210	23.31
ගම්පහ	492	18.19	197	21.86
අනුරාධපුරය	104	3.84	39	4.33
මහනුවර	134	4.95	43	4.77
වව්නියාව	1	0.04	0	-
කළුතර	302	11.16	108	11.99
රත්නපුර	100	3.70	27	3.00
ගාල්ල	116	4.29	53	5.88
කුරුණෑගල	230	8.50	60	6.66
පුත්තලම	28	1.04	8	0.89
යාපනය	1	0.04	0	-
පොළොන්නරුව	45	1.66	12	1.33
ත්‍රිකුණාමලය	13	0.48	11	1.22
මුලතිව්	0	-	0	-
බදුල්ල	74	2.74	17	1.89
මාතලේ	49	1.81	9	1.00
හම්බන්තොට	74	2.74	18	2.00
කෑගල්ල	146	5.40	39	4.33
මඩකලපුව	1	0.04	2	0.22
අම්පාර	33	1.22	12	1.33
මොනරාගල	64	2.37	12	1.33
නුවරඑළිය	47	1.74	5	0.55
මන්නාරම	0	-	0	-
මාතර	69	2.55	19	2.11
එකතුව	**2705**	**100**	**901**	**100**

ප්‍රස්තාරය **01 -** **2022** වර්ෂයේ ණය ලබා ගත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක ප්‍රතිලාභීන් දිස්ත්‍රික්ක අනුව.



වගුව - 2021 හා 2022 වර්ෂවල රාජ්‍ය සේවා ප්‍රතිලාභීන් තනතුරු අනුව

තනතුර	2022	2021
කෝප්‍රල්	590	115
හමුදා සෙබල	85	18
හමුදා සැරයන්	190	25
මේජර්	48	13
ලුතිනන්	16	5
බ්‍රිගේඩියර්	1	0
අරක්කැමි	8	7
භෝජනාගාර සේවක	12	4
පොලිස් කොස්තාපල්	294	154
පොලිස් සැරයන්	223	152
පොලිස් පරීක්ෂක	9	5
ප්‍රධාන පොලිස් පරීක්ෂක	22	9
උප පොලිස් පරීක්ෂක	50	12
පොලිස් ආරක්ෂක සහායක	1	0
පොලිස් සිවිල් සහායක	2	0
ගිනිහටයන්	18	5
රියදුරු	94	52
රිය සහායක	1	2
බන්ධනාගාර නියාමක	8	1
මැනුම් සහායක	5	0
සෞඛ්‍ය පරිපාලක	0	0
උපස්ථායක	1	0
සාමාන්‍ය කම්කරු	266	80
කාර්යාල කාර්යය සහායක	285	94
කළමනාකරණ සහකාර	147	42
සංවර්ධන සහකාර	41	19
ආයුර්වේද වෛද්‍ය සහායක	0	0
ඖෂධවේදී	2	1
මුරකරු	12	9
ආරක්ෂක නියාමක	3	1
මෝටර් කාර්මික	5	0
කාර්මික ශිල්පි	0	0
වඩු කාර්මික නිලධාරී	2	0
මානව සම්පත් සහකාර	0	0
පරිපාලන නිලධාරී	6	0
පෙදරේරු	1	0
ගණකාධිකාරී	13	3
ගබඩා සහායක	1	3
විදුලි කාර්මික	2	0
ඔවර්සියර්	7	0
සහකාර අධ්‍යක්ෂක	17	2
සහකාර ලේඛම්	1	2
පුනුරුත්ථාපන නිලධාරී	0	0
සිතාසිකරු	0	1
වනජීවී ආරක්ෂක නිලධාරී	2	2
කාලගුණ විද්‍යා නිලධාරී	0	0
පිළිගැනීමේ නිලධාරී	0	0
පොත් බැඳුම්කරු	1	0
ග්‍රාම නිලධාරී	0	1
වැඩසටහන් සහකාර	2	0

කොමිෂන් නොලත් නිලධාරී	47	17
ගිණුම් නිලධාරී	0	1
මැනුම් ක්ෂේත්‍ර සහායක	1	0
රසායනාගාර සහායක	1	0
කර්මාන්ත පරිපාලක	1	2
හෙද නිලධාරී	9	0
කපිතාන්	14	4
අස්ගොව්	4	1
අත් උදව්කරු	0	0
කෘෂිකර්ම උපදේෂක	0	0
පින්තාරුකරු	3	0
තාක්ෂණ නිලධාරී	3	5
තැපැල්කරු	9	0
අධීක්ෂණ නිලධාරී	2	0
තැපැල් නිලධාරී	12	0
රෙජිස්තාර්	0	0
කර්නල්	16	1
පෙර පාසල් ගුරු	1	0
කොමසාරිස්	0	0
පුස්තකාලාධිපති	0	0
පුස්තකාල සහායක	8	1
ලේත් මැෂින් ක්‍රියාකරු	0	2
මැෂින් ක්‍රියාකරු	4	0
ලෝහ පෑස්සුම්කරු	3	0
පශු වෛද්‍ය නිලධාරී	1	0
සුසාන භූමි භාරකරු	3	0
පරිවර්තක	1	0
වෙනත්	68	28
එකතුව	**2705**	**901**


2.2 2022 ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය හා ප්‍රගතිය

පහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයෙකුට මෙම අරමුදලෙන් ණය අයදුම් කළ හැක.

- විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු වසර 3 ක අවම ස්ථීර සේවා කාලයක් හිමි රාජ්‍ය සේවකයකු වීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් වසර 5 ක අවම ස්ථීර සේවා කාලයක් සපුරා තිබීම.
- ලබා දෙනු ලබන ණය මුදල් සම්පූර්ණයෙන්ම අයකර ගැනීමට තරම් ප්‍රමාණවත් සේවා කාලයක් තිබීම. (විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 59 ලෙස සලකයි)
- අයදුම්කරු සඳහා ඉහත සුදුසුකම් සහිත ඇපකරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කිරීම.
- අර්ධ රාජ්‍ය ආයතනයක සේවකයකු නම් ඇපකරුවන් දෙදෙනාගෙන් එක් අයකු අවම වශයෙන් වසර 03 ක ස්ථීර සේවා කාලයක් පවතින විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය සේවාවේ නියුතු අයකු වීම.
- සියළුම ණය අයදුම්කරුවන්ගේ මාසික වේතනයෙන් 40% සීමාව තුල ණය වාරිකය අයකර ගැනීමේ හැකියාව තිබීම.

වගුව 04 - සුදුසුකම්ලාභීන්ගෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර හා ණය නිකුත් කිරීම පිලිබඳව 2022 වසරේ ප්‍රගතිය පහත වගුවෙන් පැහැදිලි වේ.

මාසය	ණය අයදුම් කළ සංඛ්‍යාව	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය වටිනාකම (රු.)
ජනවාරි	68	154	24,250,000
පෙබරවාරි	229	202	32,995,000
මාර්තු	314	239	41,745,000
අප්‍රේල්	158	206	34,635,000
මැයි	185	160	26,080,000
ජූනි	304	218	39,950,000
ජූලි	325	209	40,925,000
අගෝස්තු	476	409	77,575,000
සැප්තැම්බර්	541	281	56,625,000
ඔක්තෝබර්	0	204	38,930,000
නොවැම්බර්	0	212	35,230,000
දෙසැම්බර්	0	211	35,200,000
එකතුව	**2600**	**2705**	**484,140,000.00**



ණය අයදුම් කළ සංඛ්‍යාව 2600 වුවද නිකුත් කල ණය සංඛ්‍යාව 2705 ක් විය මෙම වෙනසට ආසන්නම හේතුන් වන්නේ 2021 වසරේ අවසන් මාසයන් තුල ඇප අත්සන් කිරීමට නොපැමිණි අයදුම්පත් 2022 වසර තුල ලැබීම , 2021අවසන් මාසයන් තුල දි ලද යුද හමුදාවේ ණය අයදුම් පත් සඳහා ණය නිකුත් කිරීමේදී අවශ්‍ය සී.එල් බලපත්‍ර 2022 වසර තුල ලැබීමද දැක්විය හැක.

2.3 නිකුත් කල ණය සීමාවන් හා ණය මුදල් වටිනාකම

2022 වසරේ දී රු.250,000.00 ක ණය මුදල ලබා දුන් සේවා කාණ්ඩයට අයත් අයදුම්කරුවන්ට රු.350,000.00ක ණය කාණ්ඩය හදුන්වා දුන් අතර , රු.175,000.00 ක ණය මුදල ලබා දුන් සේවා කාණ්ඩයට අයත් අයදුම්කරුවන්ට රු.250,000.00ක ණය කාණ්ඩයද දී ඇත.

එමෙන්ම රු.300,000.00 ක ණය මුදල ලබා දුන් සේවා කාණ්ඩයට අයත් අයදුම්කරුවන්ට රු.500,000.00ක ණය කාණ්ඩයද 2022 වසරේදී හඳුන්වා දී ඇත.

වගුව 05 - ණය මුදල් සීමාවන් අනුව ප්‍රගතිය.

උපරිම ණය සීමාව (රු.)	නිකුත් කල ණය සංඛ්‍යාව	ණය මුදල් වටිනාකම (රු.000)
500,000	54	27,000,000
350,000	72	25,200,000
300,000	124	37,200,000
250,000	257	64,250,000
175,000	1373	240,275,000
150,000	277	41,550,000
100,000	391	39,100,000
75,000	75	5,625,000
50,000	69	3,450,000
40,000	10	400,000
30,000	03	90,000
එකතුව	**2705**	**484,140,000**

2.4 ණය අයකරගැනීමේ ප්‍රගතිය


2019 සිට 2022 දක්වා වසර වලට අදාලව ණය මුදල් නිකුත් කිරීම හා අයකර ගැනීමේ ප්‍රගතිය 06 වන වගුවෙන් හා 03 වන ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.

- ණය මුදල් නිකුත් කිරීම - වැඩි වීම - 254.1%
- ණය අයකර ගැනීමේ - වැඩි වීම - 21.8%

වගුව 06 – 2019 සිට 2022 වසර දක්වා ණය නිකුත් කිරීම සහ ණය අය කර ගැනීම

වර්ෂය	ණය සංඛ්‍යාව	ණය නිකුත් කිරීම (රු.මි.)	ණය අයකර ගැනීම (රු.මි.)
2019	3870	466,220	473,881
2020	1735	217,880	429,989
2021	901	136,725	341,582
2022	**2705**	**484,140**	**267,060**

ප්‍රස්තාරය -03 ණය නිකුත් කිරීම සහ අයකර ගැනීමේ ප්‍රගතිය



2.5 කාර්යාල සංකීර්ණය - ලෝහෝර් ආර්යා ණය අරමුදල

2.5.1 කුලී ආදායම

ලෝහෝර් ආර්යා ණය අරමුදල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 5,500 ක් අරමුදලේ කාර්යාලය සඳහා භාවිතා කරමින් අතිරික්ත ඉඩකඩ ප්‍රමාණය පහත සහන් ආයතන වලට කුලී පදනම මත ලබා දී 2022 වර්ෂය තුල කුලී ආදායම වශයෙන් රුපියල් මිලියන 19.26 උපයා ගන්නා ලදී.

වගුව 07 – 2022 වසරේ ගොඩනැගිලි කුලී ආදායම

අනු අංක	ආයතනය	කුලියට සිටින මහල	වර්ග අඩි ප්‍රමාණය	ආදායම (රු.)
01	ලෝහෝර් ආර්යා ණය අරමුදල	3 වන මහල	5500	-
02	රථ ගාල	පතුල් මහල	5290	-
03	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	බිම් මහල	5500	7,800,000
04	සමූපකාර සේවක කොමිෂන් සභාව	1 - මහල	2415	2,700,000
05	ලංකා විදුලිබල මණ්ඩලය	1 ,2 මහල	4700	5,300,000
06	ලංකා විදුලිබල මණ්ඩලය තොරතුරු අංශය	2 - මහල	2750	3,263,141
07	කුලී පදනමට ලබා දීමට තිබේ	2 - මහල	840	-
08	MAA ඇසෝසියේට්ස්	අංක :100/20	380	198,000
			27375	19,261,141

2.5.2 අරමුදලෙහි තිරසාරභාවය


අරමුදලේ මෙහෙයුම් සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සම්බන්ධයෙන් භාරකාර මණ්ඩලයේ දැඩි අවධානය යොමුව ඇත. මෙම ආයතනය භාණ්ඩාගාරය මත හෝ අයවැය ලේඛන ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් නොවන අතර සේවක වැටුප් ඇතුළුව සියලුම වියදම් මෙහි පොලී ආදායම සහ ගොඩනැගිලි කුලී ආදායම තුලින් දරනු ලැබේ.පොලී ආදායම තුල මෙහෙයුම් විරස්ථායී බව සහතික කරනු ලබන අතර බොල් ණය, අනෙකුත් පරිපාලන වියදම් සහ ණය ආපසු අයකර ගැනීම සඳහා දැරීමට සිදුවන අනෙකුත් සියලුම වියදම් ද මෙම ආදායම තුල ආවරණය කරගැනීමෙන් අනතුරුව මහජන බැංකුවේ සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවල කර ඇති ස්ථාවර තැන්පතුවල ආයෝජනයෙන් ලැබෙන ස්ථාවර තැන්පතු පොලී ඉපයීම් යොදා ගනී.

ආයෝජන වර්ගය	බැංකුව	2022/12/31 (රු.)	2021/12/31 (රු.)
ස්ථාවර තැන්පතු	මහජන බැංකුව	118,840,782	400,849,332
ස්ථාවර තැන්පතු	ජාතික ඉතිරි කිරීමේ බැංකුව	63,766,379	24,446,002
එකතුව		**182,607,161**	**425,295,334**

2.5.3 මෙහෙයුම් ආදායම

2022 වසර තුලදී මුළු මෙහෙයුම් ආදායම රුපියල් මිලියන 113.6 ක් වූ අතර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය රුපියල් මිලියන 44.7 විය. 2021වසර තුලදී මෙහෙයුම් ආදායම හා ශුද්ධ මෙහෙයුම් අතිරික්තය පිළිවෙලින් රුපියල් මිලියන 98.8 ක් හා රුපියල් මිලියන 38.7 ක් ලෙස දක්නට ඇත. 2021 වසරේ පැවති ගෝලීය වසංගත තත්වය සමනය වී රට නැවත යතාවත් වීමත් සමඟ නැවතත් 2022 වසරේදී 2021 වසරට සාපේක්ෂව 15% ක ලාභදායීත්වයේ වර්ධනයක් අත්කරගැනීමට අරමුදලට හැකිවී ඇත.

ප්‍රස්තාරය -04 - මෙහෙයුම් ආදායම සහ මෙහෙයුම් අතිරික්තය 2019 - 2022



03

සාමාන්‍ය පරිපාලනය හා මානව සම්පත් සංවර්ධනය

3.1 කාර්ය මණ්ඩල පුහුණුව - 2022.

භාරකාර මණ්ඩළ උපදෙස් මත අත්හිටුවන ලද කාර්යය මණ්ඩළ පුහුණුව 2022 වසර තුළ දී ද ක්‍රියාත්මක නොවිනි. සේවා මුර ක්‍රමය යටතේ සේවකයන් රාජකාරියට කැඳවීම තව දුරටත් සිදු කිරීම, අත්හිටුවීම බලපැවැත්වීමට හේතු වූ අතර ඊට අමතරව රට තුළ පැවති අරගල, උද්ඝෝෂන ආදිය හේතුවෙන් සේවා ස්ථානයට පැමිණීමට පැන නැඟි ප්‍රවාහන ගැටළු ද කාර්ය මණ්ඩළ පුහුණුව කෙරෙහි යොමුවීමට කාර්ය මණ්ඩළය දක්වන ලද මන්දගාමී ආකල්ප ද කාර්ය මණ්ඩළයේ සේවක සංඛ්‍යාව අවම වීම ද යන හේතු ප්‍රධාන ලෙස බලපාන ලදි.

3.2 අරමුදලේ බඳවා ගැනීමේ හා උසස්වීමේ පරිපාටීන්.

උසස්වීම් සහ නව බඳවා ගැනීම්.

3.2.1 වාර්ෂික කාර්යය සාධන ඇගයීම සිදුකර බඳවා ගැනීමේ පරිපාටියෙහි එන උසස්වීමේ පරිපාටියට අනුව එහි සඳහන් සුදුසුකම් සියල්ල සම්පූර්ණ කරන ලද කළමනාකරණ සහකාර III ශ්‍රේණියට අයත් නිළධාරීන් හතරදෙනෙකු (04) කළමනාකරණ සහකාර II ශ්‍රේණියට උසස් කරන ලදි. පිළිවෙළින් කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ නිළධාරීන් දෙනෙකු 2022.01.16 දින සිට ද තවත් එම ශ්‍රේණියේ නිළධාරීන් දෙදෙනෙකු 2022.08.15 දින සිටද කළමනාකරණ සහකාර II ශ්‍රේණියට උසස් වීම් ලදි.

- වසර 3ක් වැනි දීර්ඝ කාළයක් මුළුල්ලේ සාකච්ඡාවෙමින් පැවති ගොඩනැගිලි නඩත්තු සහායක III (ප්‍රාථමික - අර්ධ ශිල්පීය) - කේ. සිසිර ප්‍රියන්ත මහතා ගේ උසස්වීම සම්බන්ධයෙන් උපදෙස් විමසන ලදුව මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් දෙන ලද උපදෙස් පරිදි භාරකාර මණ්ඩළයේ අනුමැතිය යටතේ 2022.01.05 දින සිට ගොඩනැගිලි නඩත්තු සහායක II ශ්‍රේණියට උසස් කිරීම බලාත්මක කරන ලදි. එම මහතාගේ මුල් පත්වීම සහ තනතුරට ලද පත්වීම් දිනයෙහි වූ වෙනස උසස්වීම ලබා දීම කෙරෙහි ගැටළු සහගතව බලපාන ලදි.

3.2.2 නව බඳවා ගැනීම්.

- 2022 වසර තුළදී කිසිදු නව බඳවා ගැනීමක් සිදු නොකරන ලදි.
- කළමනාකරණ සහකාර III ශ්‍රේණියේ පරිවාස සේවයේ නියුතු නවක නිළධාරිනියක් ද කණිෂ්ඨ සේවක මණ්ඩළයේ III ශ්‍රේණියේ රියැදුරෙක්ද 2022 වසර තුළදී අරමුදලේ සේවයෙන් ඉවත්වන ලදි.
- ඊට අනුකූලව 2022 වසර අවසානයේදී අරමුදලේ අනුමත කාර්ය මණ්ඩළයේ **කණිෂ්ඨ කළමණාකාර - තොරතුරු තාක්ෂණ තනතුරු 01** ක් ද, **කළමණාකරණ සහකාර (තාක්ෂණික) තනතුරු 01** ක් **කළමණාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු 06 ක්** ද **කාර්යාල කාර්යය සහායක තනතුරු 01 ක්** ද වශයෙන් **පූර්ණ පුරප්පාඩු සංඛ්‍යාව 9ක් විය**
- **කණිෂ්ඨ කාර්යය මණ්ඩළයේ** එක් රියැදුරුකු 2022.12.31 දින සේවයෙන් ඉවත් වීමෙන් **රියැදුරු තනතුරෙහි ද 01 පුරප්පාඩුවක් ඇතිවීම මත 2023.01.01 දිනට අරමුදල් කාර්යය මණ්ඩළයේ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 10ක් විය.**

3.3 අරමුදල් පරිශ්‍රය නඩත්තු කිරීම.

2022 වසරේ අවසාන භාගය වන විට කොරෝනා වසංගත තත්වයට ඔබින සේ සැකසූ අරමුදල් පරිශ්‍රයේ බොහෝමයක් සැකසුම් ගලවා ඉවත් කර සුපුරුදු කාර්යාලීය පරිසරය නැවත ස්ථාපිත කර ගන්නා ලදි. විෂබීජ නාශක දියර ගෙන්වීම, විෂබීජාණුහරනය කිරීමේ ක්‍රියාවලීන්ද අත්හිටුවන ලදි.

කාර්යාලයේ, නිළ බංගළාව හා ගොඩනැගිලි පරිශ්‍රයේ සුළු නඩත්තු කටයුතු කෙරෙහි එනම් විවිධ අළුත්වැඩියාවන් හා පිළිසකර කිරීම් සඳහා වැඩි අවධානය යොමු කරන ලදි.

3.3.1 අරමුදල් පරිශ්‍රයේ අත්‍යාවශ්‍ය අළුත්වැඩියා කටයුතු.

- අරමුදල් ගොඩනැඟිල්ලේ දෙවන මහලේ අංක 100 2/2 කාර්යාල කොටසේ බදු කුළීකරුවන ලංකා විදුලි බළ මණ්ඩලයේ - ආයතනික ක්‍රමෝපාය හා නියාමන කටයුතු ශාඛා කාර්යාලයේ පිරිමි වැසිකිළියේ පැන නැඟුනු හදිසි අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ඉදිරිපත් කළ රු.60,540/00 මිළ ගණන් පූර්ණව ගෙවීමට අමතරව රු.9,979/00 මුදලකට ඉදිරිපත් කරන ලද අමතර බිල්පතට රු.5,979/00 මුදලක් පමණක් ගෙවා අළුත්වැඩියා කටයුතු 2022.06.22 දින වන විට සම්පූර්ණයෙන් නිම කරන ලදි.

- <u>**අරමුදල් කාර්යාලයේ විදුලි තත්ඇදීමේ කාර්යය**</u>

  1960 දශකයේ ඉදිකරන ලද අරමුදල් කාර්යාලයේ වත්මන් විදුලි පරිපථය මේ වන විට දැඩි අවධානම් තත්වයට පත්ව ඇති බවත් එහි සමහර කොටස් වරින් වර අක්‍රිය තත්වයට පත්වීම නිසා තවදුරටත් පවතින විදුලි තතැදුම් පද්ධතිය පවත්වාගෙන යාමේ අවධානම සැළකිල්ලට ගෙන කඩිනමින් එය ප්‍රතිසංස්කරණය කිරීමේ අත්‍යාවශ්‍ය භාවය භාරකාර මණ්ඩලයේ අවධානයට යොමුවිය.අරමුදලේ අභ්‍යන්තර අලංකරණ ව්‍යාපෘතියේ අංගයක් ලෙස මූලාරම්භ කළ අරමුදල් කාර්යායයේ විදුලිය තතැදීමේ ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාව ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය විසින් සපයනු ලබන අතර විධිමත් ප්‍රසම්පාදන කටයුතු අනුගමනයෙන් තෝරාගන්නා ලද **සී/ස වෙනෝරා ඉන්ටර්නැෂනල් ප්‍රොජෙක්ට්ස් පුද්ගලික සමාගම** වෙත **රු.7,015,777.00** පිරිවැයක් යටතේ මෙම විදුලි තතැදිමේ කාර්යය සිදුකර ගැනිමටත් පවරන ලදි.

  ඒ අනුව අරමුදල් කාර්යාලයේ විදුලි තතැදීමේ කාර්යය 2022 වසර අවසානයේදී එනම් දෙසැම්බර් මාසයේදී ආරම්භ කරන ලදි.

3.4 කාර්ය මණ්ඩල පරිපාලන හා කාර්යාලීය ක්‍රමවේදයන් විධිමත් කිරීම.

- අරමුදලේ සේවයට බැඳෙන නවක පත්වීම්ලාභීන් පරිවාස කාළය තුළදි සේවයෙන් ඉල්ලා අස්වීම වළක්වාලමින් එකී නවක පත්වීම්ලාභීන්ගේ පරිවාස සේවා කාළය සම්පූර්ණ වන තෙක් සේවය කරන බවට අත්සන් කළයුතු ගිවිසුම හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම. මෙම ගිවිසුම උල්ලංඝනය කිරීමේදි මාස 3ක මූලික වැටුප ගෙවීමට යටත්ව ගිවිසුම බලාත්මක කරන ලදි.

  අරමුදලේ කාර්යය මණ්ඩළයට බඳවා ගන්නා නවක නිළධාරින්ගේ පරිවාස කාළය අවසන් වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයක් කරා යොමු කර රැකියාව කිරීමට ඔවුන්ගේ ශාරීරික යෝග්‍යතාවය පිළිබඳව වෛද්‍ය වාර්තාවක් ලබා ගැනිමට කටයුතු කිරීමේ ක්‍රමවේදය අරමුදලේ ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලදි.

- අරමුදල සතු WP-ABJ 7905 අංක දරන ත්‍රී රෝද රථයේ රියැදුරු වන එස්.එච්.පී නීල් නන්දසිරි මහතා විසින් දැනුම් දෙන ලද පැවති රෝග තත්වයන් මත ඒ මහතාව කොළඹ ජාතික රෝහලේ හෘද රෝග අංශයේ විශේෂඥ වෛද්‍යවරයා වෙත යොමු කරන ලදුව හෘද රෝග විශේෂඥ වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර බලා සැහැල්ලු රාජකාරියෙහි පමණක් යොදවන ලෙසට ලබා දෙන ලද නිර්දේශය මත නන්දසිරි මහතා විසින් මෙතෙක් කරන ලද රියැදුරු රාජකාරීන්ගෙන් නිදහස් කිරීමට කටයුතු කරන ලදි.

  ඒ අනුව අරමුදල සතු වාහන 3 ධාවනය සඳහා එක් රියැදුරකු පමණක් කාර්ය මණ්ඩළයට සිටීම හේතුවෙන් පුරප්පාඩු වන රියැදුරු තනතුර සඳහා කඩිනමින් බඳවා ගැනීමට කටයුතු කිරීමට භාරකාර මණ්ඩළ අනුමැතිය ලදින් විධිමත්ව බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවා ගැනීමේ කටයුතු සිදුකිරීම ආරම්භ කරන ලදි.

❖ මුදල් අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචි WP – CAF 5009 නිළ මෝටර් රථය හා WP-NC 2751 වැන් රථය යන රථවාහන ලෝහොර් ආර්යා ණය අරමුදලට පවරා දීම 2021 වසරේදී සිදුවන ලද අතර එම වාහන දෙකෙහිම වාහන බලපත්‍ර සහ රක්ෂණ සහතික වැඩිවන ලද වෙළඳ පොළ වටිනාකමට අනුව අරමුදල නමින් ලියාපදිංචි කිරීම 2022 වසරේදී සිදු කරන ලදි.

❖ **<u>නිළ ඇඳුම් හිමි කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට සපත්තු කුට්ටමක් ලබා දීම</u>**

කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට ලබා දෙන නිළ ඇඳුම් දීමනාවට අමතරව ආයතන සංග්‍රහයේ සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනයන්හි ඇතුලත් විධිවිධාන පරිදි නිළ ඇඳුම් හිමි කණිෂ්ඨ කාර්ය මණ්ඩලයට සපත්තු ලබා දීම සඳහා ද භාරකාර මණ්ඩලය අනුමැතිය ලද බැවින් වසර 3ට වරක් අරමුදලේ නිළ ඇඳුම් හිමි කාර්ය මණ්ඩලයට සපත්තු කුට්ටම බැගින් නිකුත් කිරීමේ ක්‍රමවේදය අරමුදල් කාර්යාලයේ ක්‍රියාත්මක කරන ලදි.

❖ මුදල් චක්‍රලේඛන සහ ආයතන සංග්‍රහයේ විධි විධාන පරිදි ආරම්භ කර පසුව පරිවයෙන් පවත්වාගෙන ආ මාණ්ඩලික නිළධාරීන් සඳහා වසර 5 කට වරක්, පරිහරණය කරන ලද කාර්යාල බෑගය ගබඩාවට භාරදීමට යටත්ව කාර්යාල බෑගයක් නිකුත් කිරීම ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා භාරකාර මණ්ඩල අනුමැතිය ලබා දෙන ලද අතර එම පරිවය වඩාත් විධිමත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදි.

❖ **<u>අරමුදල් කාර්ය මණ්ඩලයට ලබා දෙන මාසික ප්‍රවාහන දීමනාව</u>**

ව්‍යවස්ථාපිත මණ්ඩල ගණයේ ආයතන තුළ ක්‍රියාත්මක එම ආයතන වල සේවකයන් සඳහා ලබා දෙන ප්‍රවාහන දීමනාව, දෛනිකව රාජකාරියට පැමිණීමේ කොන්දේසිවලට යටත් කර අරමුදලේ සියළුම කාර්ය මණ්ඩලය වෙත 2022 අගෝස්තු 01 දින සිට ලබා දෙන ලදි. මාණ්ඩලික නොවන සියළුම කාර්ය මණ්ඩලය වෙත රු. 3250/= ක මාසික ප්‍රවාහන දීමනාවක් ද අනෙකුත් මාණ්ඩලික ශ්‍රේණි සඳහා දැනට ගෙවන මාසික ප්‍රවාහන දීමනාව සංශෝධනය කර රු.500/= කින් වැඩිකර ගෙවීමද ක්‍රියාත්මක කරන ලදි.

❖ ගණකාධිකාරී තනතුරට අදාලව වැටුප් පරිමාණයේ උපරිමත්වයට ලඟා වී ඇති ගණකාධිකාරී වෙත මීලඟ උසස්වීම ලබා ගැනීමට ආයතනික ව්‍යුහයට අනුව හැකියාවක් නොපවතින හෙයින් ඒ මහතාගේ ඉල්ලීම පරිදි දැනට ගෙවනු ලබන ප්‍රවාහන දීමනාව වැඩිකර ගෙවීමට ගන්නා ලද භාරකාර මණ්ඩලය තීරණය පරිදි ගණකාධිකාරි වෙත රු.12,500/= මුදලක් ප්‍රවාහන දිමනාව වශයෙන් ගෙවීම ක්‍රියාත්මක කරන ලදි.

❖ **<u>පරිපාලන නිළධාරි වෙත සන්නිවේදන පහසුකම් සැපයීම</u>**

පරිපාලන නිළධාරි විසින් දුරකථනය හරහා සිදුකරන රාජකාරීන් සැලකිල්ලට ගෙන රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල නිළධාරීන්ට සන්නිවේදන පහසුකම් සැපයීම යටතේ රු.1000/= ක උපරිමයකට යටත්ව මාසික දුරකථන දිමනාවක් පරිපාලන නිළධාරිනිය වෙත ලබා දීම සිදු කරන ලදි.

සන්නිවේදන පහසුකම් සළසාලීම සඳහා අනුමත කරන ලද මාසික දුරකථන දීමනාව පරිපාලන නිළධාරිනිය විසින් ප්‍රතිපූරණය කර ලබා ගැනීමේ ක්‍රමවේදය ඒ අනුව ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලදි.

❖ **<u>වාර්ෂික කාර්ය සාධන ඇගයීම</u>**

අරමුදලේ ස්ථාපිත කර ක්‍රියාත්මක කරන ලද කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්ය සාධනය ඇගයීමේ හා ලකුණු ලබාදීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පැන නැඟී ඇති ගැටළුකාරී තත්වයන් සහ ඒ හේතුවෙන් සේවකයන් අධෛර්යමත් වීමට ඇති හැකියාව සැළකිල්ලට ගෙන අරමුදල් කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්යය සාධන ඇගයීම සිදුකරන ක්‍රමවේදය සංශෝධනයට ලක් කරන ලදි.

එම සංශෝධනයන්ට අනුව කාර්ය මණ්ඩලයේ වාර්ෂික කාර්ය සාධනය, අංශ ප්‍රධානීන්ගේ ඇගයීම මත පමණක් සිදු කර පාලන භාරකාර අනුමැතිය යටතේ වැටුප් වර්ධකය ලබා දීමේ නව ඇගයීමේ ක්‍රමය අරමුදලේ ක්‍රියාත්මක කරන ලදි.

❖ **<u>පිරිමැසුම්දායක ක්‍රමවේද භාවිතයෙන් කඩදාසි හිඟය කළමනාකරණය කර ගැනීම</u>**

රටතුළ උද්ගතවන ලද කඩදාසි හිඟය හා ලිපි ද්‍රව්‍ය සඳහා පැවති අධික මිළ ගණන් සැළකිල්ලට ගෙන කඩදාසි භාවිතය අවම කරමින් ලේඛන වල මෘදුකාංග පිටපත් භාවිතයට යොමුවන ලදි. එකී පිටපත් ගබඩා කර තැබීම, ගොනුගත කිරීම, හා අභ්‍යන්තර පරිහරණය සඳහා එක් පසක් පමණක් භාවිතා කරන ලද කඩදාසි අභ්‍යන්තර පරිහරණය සඳහා යොදා ගැනීමත්, A 4 කඩදාසි දෙපැත්තම පරිහරණය කිරීමත් යනාදි අරපිරිමැසුම්දායක කාර්යාල ක්‍රමවේද අනුගමනය කරමින් කඩදාසි හිඟය කළමනාකරණය කරගන්නා ලදි.

❖ **<u>අරමුදලේ 95 වන වර්ෂ පූර්ණ සැමරුම</u>**

ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 2022 මාර්තු 26 දිනට යෙදී තිබුන 95 වන සංවත්සරය වෙනුවෙන් 2022.03.25 වන දින උදැසන අරමුදලේ භාරකාර මණ්ඩළ රැස්වීම් ශාලාවේදි සෙත් පිරිත් පිංකමක් පවත්වා ඉතා චාම් උත්සවයකින් සමරන ලදි. සෙත් පිරිත් සජ්ඣායනය අවසානයේදී අරමුදලේ නව සභාපතිතුමිය, භාරකාරවරුන්, ඇතුළු කාර්ය මණ්ඩළය සහ අරමුදල් ගොඩනැඟිල්ලේ බදු කුළී පාර්ශව නියෝජනය කරමින් පැමිණි ඒ ඒ ආයතනික නියෝජිතයින් පිළිගනිමින් 95 වන සංවත්සරය වෙනුවෙන් සංකේතාත්මකව කිරිබත් කපා තේ පැන් සංග්‍රහයක් ද පවත්වන ලදි.

<u>ලෝහෝර් ආර්යා ණය අරමුදලේ 95 වන සංවත්සරයේ විශේෂ අවස්ථා</u>













3.5 කාර්ය මණ්ඩල ණය.

- අරමුදලින් මහජනතාව වෙත නිකුත් කරන ණය සඳහා අයකරන පොළී ප්‍රතිශතය 10% දක්වා අවම කළ බැවින් කාර්ය මණ්ඩලය වෙත නිකුත් කරන ණය සඳහා ද මේ වන තෙක් හීන වන ශේෂ ක්‍රමය යටතේ පැවති 11.5 % පොළී අනුපාතය 10% දක්වා 2022.03.29 දින සිට අවම කිරීමට ක්‍රියා කරන ලදි. ඒ අනුව කාර්ය මණ්ඩල ණය 10% අඩු කරන ලද නව ණය පොළී ප්‍රතිශතය යටතේ නිකුත් කරන ලදි.

- 2021 වසරේදී කාර්ය මණ්ඩල ණය ක්‍රමවේදයට හඳුන්වා දුන් කාර්යය මණ්ඩලයට හෝ ඔවුන්ගේ දුවා දරුවනට ටැබ් පරිගණක යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා 4.5% පොළී අනුපාතිකය යටතේ රු.100,000/00ක ණය මුදලක් ප්‍රදානය කිරීමේ නව ණය ක්‍රමවේදය සංශෝධනයට ලක් කරන ලදි. සංශෝධිත ක්‍රමය යටතේ ටැබ් යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා වන ණය මුදල වසර (3) තුනකට වරක් කාර්ය මණ්ඩලයට ලබා ගැනීමට ප්‍රතිපාදන සළස්වන ලදි.

අරමුදල මගින් නිකුත් කරන ණය මුදල් සඳහා අය කරන ලද 11.5% පොළී ප්‍රතිශතය 10% දක්වා අඩු කිරීම මත ඉහළ යන ලද ණය ඉල්ලුම කළමනාකරණය කර ගැනීම සඳහා 2022.09.01 දින සිට අරමුදලින් ප්‍රදානය කරන උපරිම ණය මුදල රු.ලක්ෂ 300,000/= කට සීමා කරන ලදි.

3.6 ඉඩම් ඔප්පු සහ බැඳුම්කර.

අරමුදල ආරම්භ කළ අවධියේදී, ඉඩම් (ඔප්පු) ඇපයට තබා ණය ලබා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වී ඇත. මෙම ක්‍රමය යටතේ ණය ලබා දුන් ඇප බැඳුම්කර 267 ක් 1960 වසරේ සිට මෙම ආයතනයට වගකීමක්ව පවතී. මෙම ක්‍රමය යටතේ ණය දීම තවදුරටත් ක්‍රියාත්මක නොවන බැවින් විධිමත් විගණන කමිටු නිර්දේශයකින් අනතුරුව , එම බැඳුම්කර අදාළ දේපළ පිහිටා ඇති ප්‍රදේශ අනුව එම දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයවලට බැඳුම්කර නිදහස් කර ඒවායේ සඳහන් පාර්ශවයන් නමින් එකී අවලංගු කිරීම් ලියාපදිංචි කර තවදුරටත් මෙම ආයතනය වෙත පැවරී ඇති වගකීම අවසන් කිරීමට 831 භාරකාර මණ්ඩල විසින් අනුමැතිය ලබා දෙන ලදී. ඊට අදාලව බැඳුම්කර 191 නිදහස් කර ඇති නමුත් 2022.01.01 සිට 2022.12.31 දින දක්වා කාළය තුළ බැඳුම්කර නිදහස් කිරීමක් සිදුවූයේ නැත.

3.7 භාරකාර මණ්ඩල රැස්වීම්.

2022 වසර තුළ භාරකාර මණ්ඩළ රැස්වීම් 13ක් පවත්වන ලදි.

2022.03.29 වන දින සිට අරමුදලේ භාරකාර මණ්ඩළයේ සභාපති ධුරයට මුදල් අමාත්‍යාංශයේ වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂිකා ජේ.කේ. එන්. සමන්මලී මහත්මිය පත්වන ලදි. වසර 06 ක පමණ කාලයක් පුරා අරමුදලේ උන්නතිය වෙනුවෙන් ඉටුකළ සේවය අගයකර හිටපු භාරකාර මණ්ඩළ සභාපති ඒ. පී. කුරුම්බලපිටිය මහතා වෙත සමරු ඵලකයක් පිරිනමන ලදි.

3.8 විගණන හා කළමණාකරණ කමිටුව.

2022 වසරේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පහත සඳහන් පරිදි පවත්වන ලදි. විමසුම් සම්බන්ධ ලේඛන විගණක කමිටුවේදී සාකච්ඡා කර භාරකාර මණ්ඩලයේ උපදෙස් සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.එමෙන්ම එකී විමසුම් වාර්තා වලින් පැන නැඟුනු වැදගත් කරුණු භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක කරන ලදි.

අනු අංකය	කමිටු පැවැත්වූ දිනය
01	2022.03.21
02	2022.06.22
03	2022.10.12
04	2022.12.15

04

අනාගත සැලසුම්

- වර්තමානයේ රාජ්‍ය සේවකයන්ට පමණක් සපයනු ලබන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය පහසුකම් අනාගතයේ දී පෞද්ගලික අංශයේ සේවකයින්ට ද ලබා දීමට හැකි වන පරිදි මුදල් උත්පාදනය කර ගැනීම සඳහා ලෝහෝර් ආර්යා අරමුදල් පනතේ වගන්ති වර්තමානයට ගැලපෙන අයුරින් සංශෝධනය කිරීම.

- අරමුදල සේවා සම්පාදන මට්ටමේ ණය දෙන ආයතනයක් බවට පත්කොට එහි වපසරිය සහ ක්‍රියාකාරකම් ණය ලාභීන්ට ප්‍රයෝජනවත් පරිදි වෙනස් කිරීම.

- අභ්‍යන්තර අළංකරණ කාර්යය යටතේ අරමුදල් කාර්යාලයේ විදුලි තත් ඇදීමේ කාර්යය නිම කරවා ගැනීම

ස්වාධීන විගණකගේ වාර්තාව
ලෝහෝර් ආර්යා ණය අරමුදල් සාමාජිකයන් වෙත

මූල්‍ය ප්‍රකාශන විගණනය මත වාර්තාව

මතය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය තත්ව ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනයන් සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත ලෝහෝර් ආර්යා ණය අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අප විසින් විගණනය කරන ලදී.

2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව අප විසින් දරන්නා වූ මතය වේ.

මතය සඳහා පදනම

අප විසින් අපගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට (ශ්‍රී.ල.වි.ප්‍ර.) අනුකූලව සිදු කරන ලදී. එම ප්‍රමිතීන්ට අනුකූලව අපගේ වගකීම් පිළිබඳව අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම යන ඡේදය යටතේ වැඩිදුරටත් විස්තර කෙරේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආචාර ධර්ම සංග්‍රහයේ සඳහන් ආචාර ධර්ම අවශ්‍යතාවයන්ට අනුකූලව අපගේ මූල්‍ය ප්‍රකාශන විගණනයට අදාළ වන පරිදි අප අරමුදලෙන් ස්වාධීන විගණකවරු ලෙස කටයුතු කරන අතර, ආචාර ධර්ම සංග්‍රයයේ දැක්වෙන අනෙකුත් වෘත්තීය ආචාර ධර්මයන්ට අනුකූලව ද අප විසින් කටයුතු කර ඇත. අප ලබා ගත් විගණන සාක්ෂි අපගේ මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බව අප විශ්වාස කරමු.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ කළමනාකාරීත්වයේ සහ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයන්ගේ වගකීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකාරීත්වයේ වගකීම වන අතර, එකී මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු වීම සඳහා අවශ්‍යයැයි හැඟෙන අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දී භාවිතා කිරීමට ද කළමනාකාරීත්වය වගකීමෙන් බැඳේ.

ආයතනය ඈවර කිරීමට හෝ මෙහෙයුම් කටයුතු නැවැත්වීම තීරණය කර ඇති විටක හෝ ඉහත විකල්පයන් හැර වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක හැර ආයතනය විසින් අඛණ්ඩ පැවැත්ම උපකල්පනයට අනුකූලව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම කළමනාකාරීත්වයේ වගකීම වේ.

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම, සමාගමේ පාලනය පිළිබඳ වගකිව යුතු පාර්ශවයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ අපගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම අපගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මූල්‍ය ප්‍රකාශනවල විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් පිළිබඳ වැඩිදුර විස්තර කිරීමක් ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති කමිටුවේ වෙබ් අඩවිය වන : http://slaasc.com/auditing/auditorsresponsibility.php හි දක්වා ඇත. මෙම විස්තරය අපගේ විගණක වාර්තාවේ කොටසකි.

වරලත් ගණකාධිකාරීන්
දිනය : 2023/06/01
රාජගිරිය

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2022 දෙසැම්බර් **31** දිනට
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

	සටහන	31/12/2022	31/12/2021
		රු.	රු.
පොලී ආදායම	**5**	57,862,585	62,797,935
අනෙකුත් ආදායම්	**6**	55,713,743	36,058,370
		113,576,327	**98,856,305**
මෙහෙයුම් වියදම්			
පුද්ගල වැටුප් වියදම්	**7**	(34,356,814)	(35,221,534)
භූමිය, උපකරණ, ආයතනික වියදම්	**8**	(16,841,466)	(14,450,374)
ගාස්තු සහ කොමිස්	**9**	(1,881,816)	(684,434)
		(53,080,095)	**(50,356,342)**
බදුකරණයට පෙර ලාභය		**60,496,232**	**48,499,963**
බදු වියදම්	**10**	**(15**,818,536)	(9,749,747)
වර්ෂය සඳහා ලාභය		**44,677,696**	**38,750,216**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

	සටහන	31/12/2022	31/12/2021
		රු.	රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	11	79,785,213	79,963,687
ආයෝජන (දේපල)	12	24,266,664	25,257,140
		104,051,877	**105,220,827**
ස්ථාවර තැම්පතු මත ආයෝජනය	13	182,607,160	425,295,334
ජංගම වත්කම්			
භාණ්ඩ ලේඛණ	14	1,085,436	325,555
අනෙකුත් වත්කම්	15	14,943,465	6,962,671
ණය සහ අත්තිකාරම්	16	500,930,482	217,228,841
මූල්‍යමය හා කෙටි කාලීන වත්කම්	17	12,158,144	11,796,966
		529,117,527	**236,314,033**
මුළු වත්කම්		**815,776,563**	**766,830,194**
අරමුදල්,සංචිත සහ වගකීම්			
සමුච්චිත අරමුදල		621,694,922	576,887,092
ප්‍රත්‍යා ගණන සංචිත		146,649,586	146,649,586
මුළු අරමුදල් හා සංචිත		**768,344,508**	**723,536,678**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	18	22,579,760	22,696,045
		22,579,760	**22,696,045**
ජංගම වගකීම්			
අනෙකුත් වගකීම්	19	14,572,893	15,092,994
ආදායම් බදු	20	10,279,402	5,504,476
		24,852,295	20,597,470
මුළු වගකීම්		**47,432,055**	**43,293,515**
මුළු අරමුදල්,සංචිත සහ වගකීම්		**815,776,563**	**766,830,194**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් සම්බන්ධ කර කියවිය යුතුයි. එමෙන්ම සටහන් මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය අංගයක් වේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇති බවට මින් සහතික වෙමි.

.....
ගණකාධිකාරි

මෙම මූලය ප්‍රකාශන පිලියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම භාරකාර මණ්ඩලය විසින් දරනු ලැබේ.

භාරකාර මණ්ඩලය වෙනුවෙන් අත්සන්

.....
සභාපති
දිනය : 2023.06.01

.....
පාලන භාරකාර
දිනය : 2023.06.01

	ප්‍රත්‍යා ගණන සංචිතය	සමුච්චිත ලාභය රු.	මුළු ශුද්ධ වත්කම් රු.
2020.12.31 දිනට ශේෂය	146,649,586	538,155,582	**684,805,168**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	(18,705)	(18,705)
වසරේ ලාභය	-	38,750,216	38,750,216
2021.12.31 දිනට ශේෂය	**146,649,586**	**576,887,093**	**723,536,679**
2021/12/31 දිනට ශේෂය	146,649,586	576,887,093	**723,536,679**
පෙර වසර සඳහා වූ ගැලපීම්	-	130,134	130,134
වසරේ ලාභය	-	44,677,696	44,677,696
2022.12.31 දිනට ශේෂය	**146,649,586**	**621,694,922**	**768,344,508**

ලෝහෝර් ආර්යා ණය අරමුදල
2022 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2022/12/31 රු.	2021/12/31 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
වසරේ ශුද්ධ ලාභය	60,496,232	48,499,963
ගැලපීම්		
ක්ෂය	4,392,573	4,436,608
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	(116,285)	3,782,405
පෙර වසර සඳහා වූ ගැලපීම්	130,134	(18,705)
වත්කම් බැහැර කිරීම මත ලාභය	-	(11,940)
ඉතුරුම් මත පොලී ආදායම	(45,774)	-
ස්ථාවර තැම්පතු මත පොලී ආදායම	(35,520,016)	(17,782,634)
මෙහෙයුම් වත්කම් වෙනස් වීමට පෙර මෙහෙයුම් ලාභය	**29,336,864**	**38,905,697**
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් මුදල් ප්‍රවාහය		
භාණ්ඩ ලේඛන (වැඩිවීම්/අඩුවීම්)	(759,881)	(31,828)
ණය සහ අත්තිකාරම් (වැඩිවීම්/අඩුවීම්)	(283,701,641)	124,915,434
අනෙකුත් වත්කම් (වැඩිවීම්/අඩුවීම්)	(7,980,794)	(260,327)
අනෙකුත් වගකීම් (වැඩිවීම්/අඩුවීම්)	(520,101)	(38,199)
	(292,962,417)	**124,585,080**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(263,625,553)	**163,490,778**
පාරිතෝෂි ගෙවීම්	-	(1,932,900)
බදු ගෙවීම්	(11,043,610)	(10,403,160)
	(11,043,610)	**(12,336,060)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද/ භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය	**274,669,163**	**151,154,718**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම්	(3,223,622)	(276,087)
ආයෝජන වල (වැඩිවීම්/අඩුවීම්)	242,688,173	(171,636,037)
දේපල,පිරියත සහ උපකරණ විකිණීම	-	24,862
ලද පොලී	35,565,790	16,472,270
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**275,030,341**	**(155,414,991)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
මුදල් හා සමාන දෑ වල ශුද්ධ (වැඩිවීම්/අඩුවීම්)	361,178	(4,260,273)
වර්ෂය ආරම්භයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	11,796,966	16,057,239
වර්ෂය අවසානයේ දී ඇති මුදල් හා ඒ සමාන දෑ	**12,158,144**	**11,796,966**
වර්ෂ අවසානයේ ශේෂ පත්‍රය/ මුදල් සහ ඒ හා සමාන දෑ		
තැම්පතු මුදල්	12,138,144	11,776,966
අතැති මුදල්	20,000	20,000
	12,158,144	**11,796,966**

ලෝහෝර් ආර්යා ණය අරමුදල

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්

ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති

01. පොදු

1951 අංක 38 දරන ලෝහෝර් ආර්යා ණය අරමුදලේ (භාරකාර මණ්ඩලය) පනත (1956 සංශෝධිත) මඟින් ස්ථාපනය කරන ලද ලෝහෝර් ආර්යා ණය අරමුදල ශ්‍රී ලංකාවේ නිත්‍යවාසික අරමුදලකි. අරමුදලෙහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 02, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි අංක 100,3/2 දරණ ස්ථානයේ පිහිටා ඇත.

1.1 අනුකූලතා ප්‍රකාශණය

මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කර ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලවය. (SLPAS)

1.2 මූල්‍ය ප්‍රකාශණ සඳහා වගකීම

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා භාරකාර මණ්ඩලය වගකීම දරයි.

1.3 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශණ ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

1.4 ශේෂපත්‍ර දිනට පසු සිදුවීම්

සියළුම ද්‍රව්‍ය පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම් සැලකිල්ලට ගනු ලැබ ඇති අතර අවශ්‍යතන්හි මූල්‍ය ප්‍රකාශන සඳහා වූ අදාල සටහන් වල ගැලපුම් හෝ අනාවරණයන් සිදුකර ඇත.

1.5 බදු

වර්තමාන බදු
මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් වන ආදායම් බදු ගණනය ආදායම් බදු විධිවිධාන අනුකූලව ආදායම් හා වියදම් මුලද්‍රව්‍ය මත 2017 අංක 24 දරණ සංශෝධිත ආදායම් බදු පනතට අනුව සිදු කර ඇත.

1.6 ආනුශංගික තොරතුරු

ණය අරමුදලට අදාල වන ප්‍රතිපත්තීන් වෙනත් ආකාරයකින් විශේෂයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස, පූර්ව වර්ෂයේ යොදා ගන්නා ලද ප්‍රතිපත්තීන් හා අනුකූල වේ. ප්‍රවර්ථන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවස්ථාවන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත පිළියෙල කර තිබේ.

02. වත්කම් සහ එහි වටිනාකම් තක්සේරු කිරීමේ පදනම

2.1 බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන

බොල් ණය සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සපයනු ලබන්නේ භාරකරුවන් විසින් සිදුකරනු ලබන සමාලෝචන පදනම් කරගෙන වන අතර පාරිභෝගිකයින් සඳහා වූ ණය වාර්තාකරනු ලබන කාල සීමාව අවසානයේදී ඉදිරියට ගෙන යන ලද හිඟ ශේෂයෙන් සපයනු ලබන ප්‍රතිපාදන අඩු කර තිබේ.

2.2 ස්ථාවර තැන්පතු

නුදුරු අනාගතයේ දී කෙටිකාලීන වෙළඳාමක් සඳහා ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ස්ථාවර තැන්පතු සහ අනෙකුත් පොලී තැන්පත් සුරැකුම්පත් සඳහා වියදම් වශයෙන් එකතු කරනු ලැබේ.

2.3 දේපල පිරියත සහ උපකරණ

දේපල පිරියත සහ උපකරණ මිලදි ගැනීමේ පිරිවැය සහ ඒ මත යෙදෙන යම් වියදම් ද දක්වා තිබේ.මෙම වත්කම් පහත සඳහන් කර ඇති සමුච්චිත ක්ෂය කිරීම් අඩුකර ලැබෙන පිරිවැයට දක්වා ඇත.

ගොඩනැගිලි	4%
පරිසණක උපකරණ	25%
ගෘහ භාණ්ඩ සවි කිරීම්	10%
කාර්යාල උපකරණ	10%
විදුයුත් අනුසිහුම්	10%
මෝටර් රථ	25%

2008/09 වසරේ සිට ණය අරමුදල එහි ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස් කර ඇත්තේ වත්කම් මිලදී ගත් දින සිට ඒවා බැහැර කරන මාසය දක්වා ක්ෂය කිරීම පිණිසය.

2007/08 වසර සඳහා වර්ෂය තුලදි භාවිතා කරන ලද වත්කම් සඳහා ද ක්ෂය කිරීම සිදු නොකරන ලද අතර වත්කම් බැහැර කරන වසර තුළදි ද ක්ෂය කිරීම සිදු නොකරන ලදි.

2.4 අනෙකුත් ලැබිය යුතු දෑ

අනෙකුත් ලැබිය යුතු දෑ සඳහන් කර ඇත්තේ එම නිශ්කාශනය කිරීම සඳහා තක්සේරු කරන ලද ප්‍රමාණයට අනුවය.

2.5 මුදල් හා ඒ සමාන දෑ

මුදල් හා මුදල් සමාන අයිතම ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයෙන් යුතු ආයෝජන මුදල් අගයට සැලකිය යුතු වෙනසක් ඇති නොවන ආකාරයට මුදල් හුවමාරු කර ගත හැකි මූල්‍යමය වත්කම් ලෙස නිර්වචනය කර ඇත.

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශණය වක්‍ර ක්‍රමය භාවිතා කරමින් පිළියෙළ කර ඇත.

03. වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි දන්නා සියළුම වගකීම් ඉදිරිපත් කර තිබේ.

3.1 ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශන සඳහා අදාල සටහන් වල අරමුදලෙහි ප්‍රාග්ධන බැඳීම් අනාවරණය කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම ප්‍රතිලාභ සඳහා ප්‍රතිපාදන සපයා ඇත. භාරකාර මණ්ඩලය විසින් යොදා ගනු ලබන පාරිතෝෂික සමීකරණයට අනුකූලව ප්‍රතිපාදන ගණනය කර තිබේ.

3.3 නිශ්චිත දායකත්ව සැලැස්ම - සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල.

ව්‍යවස්ථාපිත තත්ත්වයන් හා රෙගුලාසි මත ලෝහෝර් ආර්යා ණය අරමුදල් කාර්ය මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට දායක වී ඇත. අරමුදල විසින් 16% සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වයක් ද, 3% සේවක භාරකාර අරමුදල සඳහා දායකත්වයක් ද සෑම සාමාජිකයෙකු වෙනුවෙන්ම දරනු ලබයි.

04. ආදායම් ප්‍රකාශනය

4.1 ආදායම් හඳුනා ගැනීම

4.1.1 ණය පොලී ආදායම

ණය පොලී ආදායම උපචිත පදනම මත ගණනය කර ඇත.

රාජ්‍ය අංශයේ සේවකයන්ට ලබාදුන් ණය වලින් මාස 03 ක් සඳහා ණය ප්‍රතිපාදන නොලැබුණු ක්‍රියාකාරී නොවන ණය පිළිබඳ අරමුදල අවධානය යොමු කරන අතර ඉන් පසුව එම ණය මත ලැබෙන පොළිය මුදල් පදනම මත ගණනය කරනු ලබයි.

4.1.2 බදු කුලී ආදායම

බදු ගිවිසුම මත අරමුදල් පරිශ්‍රයේ පදිංචිව සිටින කුලී නිවැසියන්ගේ ගොඩනැගිලි කුලී ආදායම උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

4.1.3 වියදම් හඳුනාගැනීම

ණය අරමුදල අබන්ධව පවත්වාගෙන යාමට සහ ස්ථාවර වත්කම් කාර්යක්ෂමව පවත්වාගෙන යාමෙහිලා ජනිත වන සියළුම වියදම් වසරේ ලාභය ගණනයේදී ආදායමෙන් අඩුකර පෙන්වයි.

යම් වත්කමක පවත්නා ස්වභාවය වැඩිදියුණු කිරීමට ව්‍යාප්ත කිරීමට වත්කමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් දරනු ලබන හෝ ණය අරමුදලෙහි ඉපයීම් ධාරිතාව වැඩිදියුණු කිරීමෙහිලා ජනිත වන සියළුම වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලබයි.

		31/12/2022 රු.	31/12/2021 රු.
5	**ආදායම්**		
	රාජ්‍ය සේවකයින් සඳහා වූ ණය	56,901,010	62,043,340
	පොලී ආදායම් - 11.5% (රු.250,000/- කාර්ය මණ්ඩල ණය)	511,324	42,694
	නව කාර්ය මණ්ඩල ණය මත පොලී - 4.5%	318,194	311,471
	ටැබ් යන්ත්‍ර ණය මත පොලී	103,560	44,625
	පොලී ආදායම් - 11.5% (රු.100,000/- කාර්ය මණ්ඩල ණය)	26,734	353,531
	විශේෂ අත්තිකාරම් ණය මත පොලී	1,615	2,202
	පාපැදි ණය මත පොලිය	147	71
		57,862,585	**62,797,935**
6	**අනෙකුත් ආදායම්**		
	ස්ථාවර තැම්පතු සඳහා පොලිය	35,520,016	17,782,634
	කුලී ආදායම	19,261,141	17,690,809
	අයැදුම්පත් අලෙවියෙන් ලැබූ ආදායම	387,600	149,550
	අනෙකුත් ආදායම්	251,927	39,850
	විශේෂ ආදායම්	131,000	29,000
	විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	116,285	-
	ඉතුරුම් මත පොලී ආදායම	45,774	-
	ණය අලාභ ප්‍රතිපාදන (ආපසු එකතු කිරීම)	-	366,527
		55,713,743	**36,058,370**
7	**සේවක මණ්ඩල පිරිවැය**		
	වැටුප්	17,725,092	18,702,743
	විශේෂ අත්තිකාරම්	3,928,441	403,475
	දීමනාව (කාර්ය මණ්ඩල දීමනාව)	3,511,242	4,185,644
	කාර්යාල සේවක අර්ථසාධක අරමුදල	3,477,280	3,663,057
	පාලන භාරකාරතුමියගේ දීමනාව	1,850,589	1,874,200
	වාර්ෂික ප්‍රසාද දීමනා	1,452,500	687,500
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	651,990	686,823
	පාලන භාරකාරතුමියගේ ඉන්ධන දීමනාව	541,285	245,110
	භාරකාර මණ්ඩල සාමාජික දීමනා	485,757	264,039
	සභාපති දීමනාව	392,947	434,900
	විගණන කමිටුව	120,190	86,890
	හිඟ වැටුප්	80,670	8,262
	නිළ ඇඳුම්	62,233	-
	අතිකාල	41,600	55,186
	විශේෂ ප්‍රවාහන දීමනා	35,000	-
	විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදන	-	3,782,405
	කරුණාසහගත දීමනා ගෙවීම	-	141,300
		34,356,814	**35,221,534**

		31/12/2022 රු.	31/12/2021 රු.
8	**පරිශ්‍රය, උපකරණ සහ ස්ථාපිත වියදම්**		
	ක්ෂය වීම	4,392,573	4,436,608
	මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය	2,468,094	1,860,028
	ආරක්ෂක ගාස්තු	2,044,390	1,723,550
	වරිපනම් සහ රජයේ ඉඩම් සඳහා බදු	1,865,082	1,849,720
	නඩත්තු - පරිගණක	1,281,465	800,468
	විදුලිය	1,064,294	873,560
	සනීපාරක්ෂක ගාස්තු	795,782	-
	ඉන්ධන සහ මෝටර් රථ ගාස්තු	566,649	501,841
	නඩත්තු - කාර්යාල උපකරණ	519,678	197,395
	දුරකථන	413,503	392,358
	පරීක්ෂාකිරීමේ ගාස්තු	397,440	115,160
	තැපැල් හා විදුලි පණිවිඩ	349,853	162,270
	නඩත්තු - විදුලි සෝපාන	251,850	252,081
	ගොඩනැගිලි රක්ෂණ	120,514	74,618
	ජලය	95,115	97,080
	පරිත්‍යාග	63,000	63,000
	මුද්දර ගාස්තු	49,200	57,800
	පුවත්පත් හා වාරප්‍රකාශන	45,840	32,594
	නඩත්තු - ගොඩනැගිලි	36,433	797,540
	නිල බංගලා වියදම්	11,275	14,221
	රජයේ ඉඩම් බදු	5,000	5,000
	කාර්ය මණ්ඩල සුබ සාධන - නිළ ඇඳුම්	2,655	141,572
	ප්‍රවාහන	1,780	1,910
		16,841,466	**14,450,374**
9	**ගාස්තු සහ කොමිස් මුදල්**		
	ණය අලාභ සඳහා ප්‍රතිපාදන	1,572,922	-
	වෘත්තීය ගාස්තු	205,000	205,000
	විගණන ගාස්තු	64,200	80,000
	බැංකු ගාස්තු	26,894	33,220
	නීති ගාස්තු	12,800	123,913
	උපදේශණ ගාස්තු	-	229,379
	අපහරණය කල ගිණුම	-	12,922
		1,881,816	**684,434**
10	**<u>බදු සඳහා වියදම්</u>**		
	<u>ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය</u>		
	බදු පෙර ලාභය	**60,496,232**	**48,499,963**
	අනෙකුත් ආදායම්	**3,715**	-
	බදු වලින් හිලව් කිරීමට එකඟ වී ඇති වියදම්	6,101,770	8,296,234
	බදු වලින් අඩු කිරීමට හැකි වියදම්	(691,149)	(2,630,934)
	ව්‍යාපාරයෙන් උපයන ලද පොලිය මත ලාභය	**65,910,568**	**54,165,263**
	මුළු බදු ආදායම	**65,910,568**	**54,165,263**
	ආදායම් බදු වියදම් 18%	5,931,951	9,749,747
	ආදායම් බදු වියදම් 30%	9,886,585	-
		15,818,536	**9,749,747**

11	**දේපළ පිරියත හා උපකරණ පිරිවැය**	**2022.01.01 දිනට ශේෂය රු.**	**වසර තුල දී ගැලපීම් රු.**	**වසර තුල දී ඉවත් කිරීම් රු.**	**2022.12.31 දිනට ශේෂය රු.**
	සින්නක්කරය				
	ගොඩනැගිලි	10,400,000	-	-	10,400,000
	මෝටර් රථ	16,008,750	-	-	16,008,750
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,677,439	1,537,831	-	5,215,270
	පරිගණක උපකරණ	5,914,770	823,000	-	6,737,770
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	1,444,168	-	-	1,444,168
	කාර්යාල උපකරණ	2,290,570	862,791	-	3,153,362
	බදු ඉඩම්	98,000,000	-	-	98,000,000
		137,735,697	**3,223,622**	**-**	**140,959,319**

	සමුච්චිත ක්ෂය	**2022.01.01 දිනට ශේෂය රු.**	**වර්ෂය සඳහා ගාස්තු රු.**	**වසර තුල දී ඉවත් කිරීම් රු.**	**2022.12.31 දිනට ශේෂය රු.**
	සින්නක්කර				
	ගොඩනැගිලි	8,419,045	247,619	-	8,666,664
	මෝටර් රථ	15,965,344	17,188	-	15,982,531
	විදුලි උපකරණ හා සිහුම් (සවිකිරීම්)	3,481,881	53,005	-	3,534,886
	පරිගණක උපකරණ	4,181,397	454,649	-	4,636,046
	ගෘහ භාණ්ඩ හා සවි කිරීම	994,832	100,648	-	1,095,480
	කාර්යාල උපකරණ	1,396,179	195,655	-	1,591,833
	බදු ඉඩම්	23,333,333	2,333,333	-	25,666,667
		57,772,010	**3,402,096**	**-**	**61,174,107**
	ලියාහල අගය	79,963,687			**79,785,213**

12	**ආයෝජන දේපළ** පිරිවැය/ තක්සේරුව	**2022.01.01 දිනට ශේෂය රු.**	**වසර තුල දී ගැලපීම් රු.**	**2022.12.31 දිනට ශේෂය රු.**
	ආයෝජන දේපළ	41,600,000	-	**41,600,000**
		41,600,000	-	**41,600,000**

	සමුච්චිත ක්ෂයවීම	**2022.01.01 දිනට ශේෂය රු.**	**වර්ෂය සඳහා ගාස්තු රු.**	**2022.12.31 දිනට ශේෂය රු.**
	ආයෝජන දේපළ	**16,342,860**	990,477	**17,333,336**
		16,342,860	990,477	**17,333,336**
	ලියාහල අගය	**25,257,140**		**24,266,664**

			31/12/2022 රු.	31/12/2021 රු.
13	**ස්ථාවර තැම්පතු මත ආයෝජන**			
	ස්ථාවර තැම්පතු - මහජන බැංකුව		118,840,782	400,849,332
	ස්ථාවර තැම්පතු - ජාතික ඉතිරි කිරීමේ බැංකුව සිටි ශාඛාව		63,766,379	24,446,002
			182,607,160	**425,295,334**
14	**භාණ්ඩ ලේඛණ**			
	ලිපිද්‍රව්‍ය ගබඩාව		831,508	164,099
	මුද්‍රිත ලිපිද්‍රව්‍ය		194,039	110,393
	විදුලි උපාංග		42,693	40,000
	සනීපාරක්ෂක ද්‍රව්‍ය		17,196	11,063
			1,085,436	**325,555**
15	**අනෙකුත් වත්කම්**			
	ස්ථාවර තැම්පතු මත පොලිය		12,259,394	4,475,419
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි		2,155,000	2,139,576
	ලැබිය යුතු ගොඩනැගිලි කුලි තැන්පතු		529,071	347,676
			14,943,465	**6,962,671**
16	**ණය සහ අත්තිකාරම්**			
	රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය	**16.1**	486,486,212	206,682,105
	කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	**16.2**	14,444,270	10,546,736
			500,930,482	**217,228,841**
16.1	**රාජ්‍ය ආයතන වල සේවකයන් සඳහා ණය**			
	රාජ්‍ය සේවකයින්/ රාජ්‍ය සංස්ථා සඳහා ණය			
	ක්‍රියාකාරී ණය		477,264,926	194,597,594
	ක්‍රියාකාරී නොවන ණය		12,407,638	15,643,394
			489,672,564	**210,240,988**
	ක්‍රියාකාරී නොවන - ණය සඳහා විලම්බන පොලිය		(1,560,365)	(3,505,818)
	ණය අලාභ ප්‍රතිපාදන		(1,625,986)	(53,064)
			486,486,212	**206,682,105**
16.2	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**			
	කාර්ය මණ්ඩල ණය - දස මස්		6,603,959	5,788,016
	කාර්ය මණ්ඩල ණය - 11.5% (250,000)		5,992,544	2,404,341
	කාර්ය මණ්ඩල ණය - ටැබ් ණය (4.5%)		1,622,946	2,115,759
	කාර්ය මණ්ඩල ණය - 11.5% (100,000)		175,251	230,620
	පාපැදි ණය		40,320	8,000
	උත්සව අත්තිකාරම්		9,250	-
			14,444,270	**10,546,736**
17	**මුදල් හා කෙටි කාලීන අරමුදල්**			
	මහජන බැංකුව - 204200 2300 85389 (ඉතුරුම්)		8,387,783	-
	මහජන බැංකුව - 204100 1600 85389 (ජංගම)		1,931,186	8,803,638
	මහජන බැංකුව - 204100 1800 85388 (ජංගම)		1,215,228	1,431,365
	මහජන බැංකුව - 204100 2500 85389 (ජංගම)		603,947	1,541,963
	අතැනි මුදල්		20,000	20,000
			12,158,144	**11,796,966**
18	**විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ ශේෂය		22,696,045	20,846,540
	වසර සඳහා වූ ප්‍රතිපාදන		(116,285)	3,782,405
	වසර තුල දී ගෙවීම්		-	(1,932,900)
	වසර අවසාන ශේෂය		**22,579,760**	**22,696,045**

			31/12/2022	31/12/2021
			රු.	රු.
19	**අනෙකුත් වගකීම්**			
	ගොඩනැගිලි කුලි තැම්පතු	**19.1**	9,320,571	9,020,571
	රාජ්‍ය සේවකයන් සඳහා ලබාදුන් ණය මුදල් වැඩිපුර අයකර ගැනීම		3,561,238	4,356,708
	උපචිත වියදම්	**19.2**	1,149,339	1,253,669
	ණය හිමියන්	**19.3**	296,745	342,046
	නැවත ගෙවිය යුතු තැන්පතු		145,000	20,000
	අනෙකුත් තැම්පතු - ආරක්ෂක		100,000	100,000
			14,572,893	**15,092,994**
19.1	**ගොඩනැගිලි කුලි තැම්පත්**			
	ජාතික ඉතිරි කිරීමේ බැංකුව		3,540,000	3,540,000
	ලංකා විදුලිබල මණ්ඩලය		2,700,000	2,400,000
	ලංකා විදුලිබල මණ්ඩලය - (තොරතුරු තාක්ෂණ අංශය)		1,631,571	1,631,571
	සමුපකාර සේවක කොමිෂන් සභාව		1,350,000	1,350,000
	MAA ඇසෝසියේට්ස්		99,000	99,000
			9,320,571	**9,020,571**
19.2	**ගෙවිය යුතු වියදම්**			
	නඩත්තු - ගොඩනැගිලි		347,907	347,907
	ආරක්ෂක ගාස්තු		175,240	153,280
	විදුලිය		109,153	92,039
	විශේෂ දීමනා		131,367	-
	ගොඩැනැගිලි රක්ෂණය		98,657	-
	ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා ගාස්තු		77,401	-
	විගණන ගාස්තු		70,000	155,000
	මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය		7,200	146,139
	දුරකථන		44,386	33,581
	වාර්ෂික ප්‍රසාද දීමනා		27,813	40,313
	ගෙවිය යුතු බදු ගොනු කිරීමේ ගාස්තුව		25,000	25,000
	මුද්දර ගාස්තු		12,225	14,825
	ජලය		11,014	7,737
	අතිකාල		10,843	-
	හිඟ වැටුප්		1,135	2,270
	උපදේශන ගාස්තු		-	229,379
	පාලන භාරකාර		-	6,201
			1,149,339	**1,253,670**
19.3	**ණය හිමියන්**			
	බොල් ණය		285,838	342,046
	ඔප්පු නිදහස් කිරීම්		10,907	-
			296,745	**342,046**
20	**බදුකරණය සඳහා ප්‍රතිපාදන**			
	වසර ආරම්භයේ දී ශේෂය		5,504,476	6,157,888
	වසර සඳහා වූ ප්‍රතිපාදන		15,818,536	9,749,747
	බදු ගෙවීම්		(11,043,610)	(10,403,160)
	වසර අවසාන ශේෂය		**10,279,402**	**5,504,476**

Govt. Press, Sri Lanka